ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි සිනමා හා රූපවාහිනී අධ්‍යයන පාඨමාලාව

# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා ඒකකය

## ලලිත කලා අධ්‍යයන අංශය, මානවශාස්ත්‍ර පීඨය

## විශ්වවිද්‍යාල ප්‍රවේශය 2017/2018

## යෝග්‍යතා පරීක්ෂණය (සිංහල මාධ්‍ය පමණි)

### ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි සිනමා හා රූපවාහිනී අධ්‍යයන පාඨමාලාව

කැලණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර පීඨය මඟින් ආරම්භ කර ඇති සිනමා හා රූපවාහිනී ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි පාඨමාලාව සඳහා 2017/2018 අධ්‍යයන වර්ෂයට අදාළ විද්‍යාර්ථීන් බඳවා ගැනීමට අපේක්ෂිත ය.

පූර්වෝක්ත උපාධි පාඨමාලාවේ අරමුණු අතර, සිනමා හා රූපවාහිනී විෂය සම්බන්ධ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මක ප්‍රවර්ධනය උදෙසා වන නිර්මාණාත්මක මානව සම්පත බිහිකිරීම ද, සිනමා හා රූපවාහිනී ක්ෂේත්‍රයෙහි නියැළීමට සුදුසු න්‍යායාත්මක හා ශිල්පීය ඥානය සහිත ශාස්ත්‍රඥයින් බිහිකිරීම හා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ උක්ත විෂය හා සම්බන්ධ පරිපාලන ක්ෂේත්‍රයට අදාළ නිලධාරීන් බිහි කිරීමද අපේක්ෂාව වේ.

සියළුම අපේක්ෂකයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිකුත් කළ "ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රථම උපාධි පාඨමාලා සඳහා ප්‍රවේශය" අත්පොතේ අංක 2.2.8 සහ 2.2.8.29 යටතේ දැක්වෙන තොරතුරුවලට අනුව පූර්වෝක්ත පාඨමාලාවට අයදුම් කිරීම අපේක්ෂා කෙරේ. යෝග්‍යතා පරීක්ෂණය ප්‍රධාන කොටස් දෙකක් යටතේ පැවැත්වීමට අපේක්ෂිත ය.

**01' ලිඛිත පරීක්ෂණය**

ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයේ දී සිනමා හා රූපවාහිනී විෂය, සාමාන්‍ය දැනුම හා නිර්මාණශීලීත්වය පිළිබඳ නිපුණතාව අපේක්ෂා කෙරේ'

**02' වාචික පරීක්ෂණය**

ලිඛිත පරීක්ෂණයේ දී ඉහළ ම ප්‍රවීණත්වයක් පළ කළ අපේක්ෂකයින්ගේ සිනමා හා රූපවාහිනී ක්ෂේත්‍රයට ඇති කැමැත්ත හා ප්‍රායෝගික ව ඔවුන් වෙතින් ප්‍රදර්ශනය කරන කුසලතා පිළිබඳ සොයාබැලීමට අපේක්ෂිත ය'

ඒ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයදුම්පත් ඉදිරිපත් කළ අපේක්ෂකයින් යථෝක්ත යෝග්‍යතා පරීක්ෂණවලට පෙනී සිට උසස් ප්‍රවීණත්වයක් පළ කළ යුතු ය.

අපේක්ෂකයින් පහත දක්වා ඇති ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් 2018 **පෙබරවාරි මස 16 දිනට පෙර** ලියාපදිංචි තැපෑලෙන් **නියෝජ්‍ය ලේඛකාධිකාරී/විභාග, කැලණිය විශ්වවිද්‍යාලය, දළුගම, කැලණිය** යන ලිපිනයට එවිය යුතු ය. කවරයේ වම්පස උඩ කෙළවර **"ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි සිනමා හා රූපවාහිනී අධ්‍යයන"** යනුවෙන් සඳහන් කළ යුතු ය. ඉල්ලුම්පත්‍රය සමග පහත සඳහන් ලේඛනවල සහතික කළ පිටපත් අමුණා එවිය යුතු යි.

I) මහජන බැංකුවේ කැලණිය ශාඛාවේ අංක 055-1001-30667553 දරන ගිණුමට රු. 750/- ක් බැරවන පරිදි ලංකාවේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට මුදල් ගෙවා ලබාගත් රිසිට්පත.

II) විදුහල්පති හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සිය නිල ලාංඡනය තබා සහතික කරන ලද 2017 අ.පො.ස. (උ/පෙළ) ප්‍රතිඵල, Z අගය සහ අ.පො.ස. (සා/පෙළ) ප්‍රතිඵල.

III) ඉහත ලේඛනවල සහ ඔබ ඉදිරිපත් කරන ඉල්ලුම්පත්‍රයේ නම සඳහන් වන ආකාරයේ යම් වෙනසක් ඇතොත් එකී වෙනස් නම්වලින් හැඳින්වෙන තැනැත්තා/තැනැත්තිය එක් අයෙකු බව තහවුරු කෙරෙන දිවුරුම් ප්‍රකාශයක්.

යෝග්‍යතා පරීක්ෂණය 2018 අප්‍රේල් මස 07 සෙනසුරාදා පැවැත්වේ. අසම්පූර්ණ හා අපැහැදිලි අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය
2018 ජනවාරි 17

---

**UNIVERSITY OF KELANIYA, SRI LANKA**

**Aptitude Test**

**Bachelor of Arts (Special) Degree Programme in Film and Television - 2017/2018**

**(Please fill in English using BLOCK letters)**

1. Full Name of Candidate (Mr. / Ms.):

2. Surname of Candidate with Initials:

3. National ID No:

4. Permanent Address:

5. Telephone No.:

6. District in which the candidate sat for the G. C. E. (A/L) Examination 2017:

7. Results at the G. C. E. (A/L) Examination 2017:

   A/L Index No: Z - Score: |__|.|__|__|

| Subject | Grade | Subject | Grade |
|---|---|---|---|
| i. ________ | __________ | iii. __________ | __________ |
| ii. ________ | __________ | iv. __________ | __________ |

8. Programme of study applied for university admission (in the order of preference indicated as in the application submitted to the University Grants Commission)

| | | |
|---|---|---|
| i. | ii. | iii. |
| iv. | v. | vi. |
| vii. | viii. | ix. |

I certify that the above particulars submitted by me are true and accurate.

……………. ……………………………
Date Signature of Applicant

**Note:**

i. Please ensure that you include (a) Deposit slip for Rs. 750/- (b) Certified result copies of G.C.E. (A/L) 2017, Z – Score and G.C.E. (O/L) (c) Affidavit, if documents carry a different name, in your application.

ii. Make sure you include your preference for B.A.(Special) Degree Programme in Film and Television Studies in your application for admission to the University Grants Commission.